# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2149/30 – 2019 නොවැම්බර් 15 වැනි සිකුරාදා – 2019.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔයපළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, ඉහළ පන්නල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක එන්යූ/ඩබ්ලිව්එල්පී/2018/127 හා 2018.08.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – කොළොන්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.8268
උතුරට: අම්බලම පාර; නැගෙනහිරට: අම්බලම පාර සහ මාර්ගය (මා.සං.අ.); දකුණට: ඩී. එම්. පී. ජී. ජයසූරිය හිමිකම් කියන දවකැටියයාය, මාර්ගය (මා.සං.අ.) සහ එච්. එම්. ප්‍රේමලතා හිමිකම් කියන කොළොන්ගහ වත්ත; බටහිරට: එච්. එම්. ප්‍රේමලතා හිමිකම් කියන කොළොන්ගහවත්ත සහ අම්බලම පාර.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2017/පීසී/391.
2019 ඔක්තෝබර් මස 18 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 1546

1A – G31464 – 36(2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.